# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1681/29 - 2010 නොවැම්බර් 23 වැනි අඟහරුවාදා - 2010.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 03

2004 දෙසැම්බර් මස 24 වැනි දින හා අංක 1372/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලය නියෝග කර ඇත.

14.3.4 උප වගන්තියට අවසන පහත සඳහන් නව උප වගන්තීන් ඇතුළත් කරනු ලැබේ :

(අ) 2004.12.24 දිනට ප්‍රථම රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බැඳුනු සහ 2012.07.01 දිනට ප්‍රථම විශ්‍රාම යාමට නියමිත අයවලුන් සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමෙන් නිදහස් කරනු ලැබේ.

(ආ) සෙසු අය 2012.07.01 දිනට ප්‍රථම රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් දෙවන භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කළ යුතුය.

(ඇ) 2012.06.30 දින දක්වා සියලුම රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ට දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමකින් තොරව ස්වකීය වැටුප් වර්ධක උපයා ගැනීමට සහ නියමිත උසස් වීම් ලබා ගැනීමට හිමිකම් ලබා දිය යුතුය.

බී.පී.පී.එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2010 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

12-252

1A - G 13790 — 335 (2010/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.